කැලණිය විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර පීඨය - වාග්විද්‍යා අධ්‍යයන අංශය

**භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව**

**2025/2026 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම**

ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කරගැනීම සඳහා 2025 අගෝස්තු මස 31 සිට 2025 සැප්තැම්බර් මස 30 වන දින තෙක් අයදුම්පත් භාරගැනේ.

මෙය භාෂා පරිවර්තනය සහ භාෂණ පරිවර්තනය පිළිබඳ සෛද්ධාන්තික දැනුම සහ ප්‍රායෝගික පුහුණුව ලබාදීමට සුදුසු වන පරිදි සකස් කරන ලද පාඨමාලාවකි.

**පාඨමාලාවේ සංයුතිය:**

I දෙමළ - සිංහල පරිවර්තනය (සිංහල සහ දෙමළ භාෂා ප්‍රවීණතාව ඇති අපේක්ෂකයන්ට)

II ඉංග්‍රීසි - සිංහල පරිවර්තනය (ඉංග්‍රීසි සහ සිංහල භාෂා ප්‍රවීණතාව ඇති අපේක්ෂකයන්ට)

**පාඨමාලා කාලය:** අධ්‍යයන වර්ෂ එකකි. සෙනසුරාදා පෙරවරු 9.00 සිට පස්වරු 4.00 තෙක් දේශන පැවැත්වේ. දේශන කැලණිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී (onsite) පැවැත්වෙන අතර, අවශ්‍යතාව අනුව ඇතැම් දේශන මාර්ගගත ක්‍රමයට (online) පැවැත්වෙනු ඇත.

**පාඨමාලා ගාස්තුව:** රු. 75,000/= කි. (රුපියල් හැත්තෑ පන් දහසකි)
පළමු වැනි වාරිකය වන රුපියල් 45,000.00ක මුදල පාඨමාලා ආරම්භයේ දී ගෙවිය යුතු අතර, දෙවැනි වාරිකය වන රුපියල් 30,000.00ක මුදල මුල් මාස තුන ඇතුළත ගෙවිය යුතු ය.

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම්:** අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සමත් වීම හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ වසර 10ක අදාළ සේවා පළපුරුද්ද

**පාඨමාලාවේ ආරම්භය:** 2025 නොවැම්බර්

**අයදුම්පත්‍ර ගාස්තුව:** රු.750.00කි. මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ව ලැබෙන රිසිට් පතෙහි සඳහන් ගිණුම් අංකයට ගාස්තුව ගෙවිය යුතු ය.

**අයදුම්පත්‍රය භාරදෙන ආකාරය:** https://hu.kln.ac.lk/depts/linguistics/ වෙබ් පිටුවෙහි පළ කොට ඇති මාර්ගගත අයදුම්පත්‍රය (online application) සම්පූර්ණ කිරීමෙන් පසු ව එහි මුද්‍රිත පිටපතක් සහ මහජන බැංකුවට අයදුම් පත්‍ර ගාස්තුව ගෙවා ලබාගත් රිසිට් පත සමග උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, උසස් පෙළ විභාග සහතිකය යන ලේඛනයන්හි පිටපත් 2025 සැප්තැම්බර් මස 30 දින හෝ එයට පෙර ලැබෙන සේ **සම්බන්ධීකාරක, භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව, වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, අංක 218 නුවර පාර, දළුගම, කැලණිය 11600** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ ඉහළ වම් කෙළවරේ "**භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය - 2025/2026**" යනුවෙන් සඳහන් කළ යුතු ය.

- බඳවාගනු ලබන විද්‍යාර්ථීන් සංඛ්‍යාව සීමාසහිත බැවින්, අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි ය. අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ අනුව ප්‍රමුඛතාව හිමි වේ.

- පාඨමාලාව සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා 0112 908 786 දුරකථන අංකයෙන් වාග්විද්‍යා අධ්‍යයන අංශය ඇමතීමට, dtri@kln.ac.lk යන විද්‍යුත් තැපැල වෙත විද්‍යුත් පණිවිඩයක් යොමු කිරීමට හෝ https://hu.kln.ac.lk/depts/linguistics/ සබැඳිය ඔස්සේ වාග්විද්‍යා අධ්‍යයන අංශයේ වෙබ් අඩවියට පිවිසීමට කටයුතු කරන්න.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2025.08.31